# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,130 — 1960 මැයි 13 වැනි සිකුරාද — 13.5.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 331 | තොවුපල් ටෙන්ඩර් හා වෙනත් ටෙන්ඩර් විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 333 | ආණ්ඩුවේ තොවන දැන්වීම් ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 335 | රට හිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 338 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායෘී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවා මෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීනු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එන තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු හැලෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

**(iv)** සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ඉල්ලා සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉනා ඇතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉනා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටිනු අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාතීමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපෙක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතු වෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### ගබඩාකාර තනතුර

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ චිත්‍රපට ආයතනයේ ගබඩාකාර තනතුරක් සඳහා ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

පහත දැක්වෙන ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1960 මැයි 26 වැනි දින හෝ ඊට ප්‍රථම හෝ මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

**2. වැටුප :** මෙම තනතුරට නියමිත වැටුප් ක්‍රමය අවුරුද්දකට රුපියල් 1,320—72—2,688 ක් දක්වා වේ.

**3. සේවයේ කොන්දේසි :** මෙම තනතුර ස්ථිර වූද, විශ්‍රාම වැටුප් රහිත වූද එකකි. පත් කිරීම කරනුයේ අවුරුදු තුනක පරීක්ෂණ කාලපරිච්ඡේදයකට යටත් කොටය.

**4. අවශ්‍ය සුදුසුකම් :** සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් සුදුසුකම් තිබෙන බව ඔප්පු කළ යුතුය :—

(1) 1960 මැයි 26 වැනි දිනට ඔහුගේ වයස අවුරුදු 18කට අඩු නොවිය යුතු අතර අවුරුදු 35කට වැඩි නොවිය යුතුය.

(2) විශිෂ්ඨ චරිතයක් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයක් තිබිය යුතුයි.

(3) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමර්ථ්‍යය ලබා සිටිය යුතුයි.

(4) ගබඩාකිරීම, ගබඩා ගණන් තැබීම සහ සුචි පිළියෙල කිරීම පිළිබඳවද පලපුරුද්දක් ද, විදුලිමය—සිනමා සහ ශබ්ද විකාශන යන්ත්‍ර යනාදී කාර්මික උපකරණ ගබඩා කිරීම සහ ගබඩා කටයුතු සම්බන්ධිත ලියකියවිලි පිළිබඳව ද ටයිප් ගැසීම ගැන ද දැනීමක් තිබෙන බව ඔප්පුකළ යුතුයි.

5. අයදුම් පත්‍ර වලට—

(අ) උප්පැන්න සහතික පත්‍රය ද,
(ආ) උසස්ම අධ්‍යාපන සහතික පත්‍ර ද,
(ඉ) ළඟදී ලබාගන්නා ලද චරිත සහතික පත්‍ර තුනක ද—
පිටපත් අමුණා එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඒ පිළිබඳ වෙනත් ලියකියවිලි කොළඹ 1, සෙනේට් ගොඩනැගිල්ලේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ වෙන කිසිම නිලධාරියකු වෙත පුද්ගලික වශයෙන් ලැබෙන්නට නොසැලැස්විය යුතුයි.

7. මෙම ගැසට් පත්‍රයේ පළවෙනි කොටසේ දෙවැනි ඡෙදයේ මූලම ආණ්ඩුවේ සේවයේ තනතුරු වලට පත් කිරීම් සම්බන්ධව ප්‍රසිද්ධ කර තිබෙන සාමාන්‍ය කොන්දේසි වලට අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

වි. ඊ. ගුණරත්න,
වැඩබලන ප්‍රවෘත්ති අධ්‍යක්ෂ.

1960 මැයි මස 5 වැනි දින,
කොළඹ 1, සෙනෙට් ගොඩනැගිල්ලේ,
ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී ය.

### ගබඩාකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. වයස සහ උපන් දිනය (උප්පැන්න සහතික පත්‍රයක පිටපතක් ඇමිණිය යුතුයි) :————.

4. ජාතිය :————.

5. උපත සිදුවූ ස්ථානය :—

(අ) ඉල්ලුම්කරු :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.

(ඇ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ ආතා :————.

(ඈ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

ඉල්ලුම්කරුගේ උපත ලංකාවේ දී සිදුවුනි නම්, (අ) ඇතුලුව (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඉල්ලුම්කරුගේ උපත ලංකාවේ දී සිදු නොවිනි නම් (අ) ඇතුළුව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.

6. විවාහක ද, අවිවාහක ද යනවග :————.

7. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ද දැන්වීමේ පරිදි උවමනා කරන පළපුරුද්ද ද සඳහන් කරනු (සහතිකපත්‍ර වල පිටපත් ඇමිණිය යුතුයි) :————.

8. ඉගෙනීම ලැබූ ස්ථානය හා එයින් අස්වූ දිනය :————.

9. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියාව :————.

10. දැනට කරණ රැකියාව (එවැන්නක් තිබේ නම්) :————.

11. චරිතසහතික පත්‍ර ලබාගත් අයගේ නම් සහ තරාතිරම් (ඒ සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

12. වෙනත් විශේෂ සුදුසුකම් :————.

මෙම ඉල්ලුම් පත්‍රයේ මා සඳහන් කළ තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

ඉල්ලුම්කරුගේ අත්සන :————.

ස්ථානය :————.

දිනය :————.

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### සිතියම් පිටපත් කරන්නකුගේ තනතුර

ඉඩම් කොමසාරිස් තුමාගේ දෙපාර්තමේන්තුවට සිතියම් පිටපත් කරන්නකු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. මෙම තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් රහිතය. මෙම ධුරය සඳහා නියමිත වැටුප් ප්‍රමාණය මෙසේ යි. රුපියල් 888 සිට රුපියල් 2,184 දක්වා රුපියල් 72 බැගින් වාර්ෂික වැටුප් වැඩි කිරීම් 18 ක්

වේ. විචක්ෂණ භාවය දක්වීමේ සීමාව වාර්ෂික වැටුප රුපියල් 1,608ක් වීමට පළමු වේ. රජයේ නියමිත ප්‍රමාණයන් අනුව යැපීමේ ආධාර සහ ගෙවල් කුලී ගෙවනු ලැබේ.

3. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම් කරුවකුම ලාංකිකයෙකු විය යුතු අතර අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 18 නො අඩු අවුරුදු 25ට නො වැඩි විය යුතුය. සෑම අයදුම්කරුවෙකුම ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත් පරීක්ෂණයෙන් චිත්‍ර කර්මය විෂයයක් ලෙස සමත්ව සිටිය යුතුය. සැලැස්ම ඇඳීමේ සහ පිටපත් කිරීමේ පළ පුරුදු කම් අතිරේක සුදුසුකම් ලෙස සැළකේ.

4. **සේවා කොන්දේසි.**—

(අ) තෝරාගනු ලැබූ අපේක්ෂකයා කොළඹ මැනුම් අධිකාරී කාර්යාලයයේ මාසයක පුහුණුවක් ලැබිය යුතුය.

(ආ) මෙම පත්වීම තෙවසක පරීක්ෂණ කාල සීමාවකට නතුවන පදවියකි.

(ඉ) තෝරා ගනු ලබන අපේක්ෂකයා දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමංසඳහා සූදානම් විය යුතුයි.

(ඊ) තෝරා ගනු ලැබූ අපේක්ෂකයා දෙපාර්තමේන්තු ප්‍රධානියා ඇවැසියැයි සළකන ඇපයක්ද තැබිය යුතුය.

5. අයදුම් පත් මැනදී ලබාගන්නා ලද චරිත සහ කායශක්ෂම භාවයේ සහතික දෙකකින්ද, ඉල්ලුම් කරුගේ උප්පැන්න සහතිකයේ සහ අධ්‍යාපන සුදුසුකම් දක්වන සහතික පිටපතක් ද අයදුම් පතට යා කොට එවිය යුතුයි. අයදුම් පත් මෙහි පෙනෙන ආදශී ෆෝරමයට අනුව සකසා 1960 ජූනි මස 4 වෙනි සෙනසුරාද හෝ ඊට පෙර අනුරාධපුර දිසාපති තුමා වෙත ලැබෙන්නට සැළැස්විය යුතුයි. අයදුම්පත් ලැබුණු බැව් දන්වනු නො ලැබේ.

6. සෑම අයදුම් පතක්ම ලියා පදිංචි කැරුණ තැපෑලෙන් එවිය යුතුයි. අයදුම් පත් එවන ලියුම් කොපුවේ වම් කෙළවර මුදුනේ "පිටපත් කරුගේ තනතුර සඳහා අයදුම්පත්" යන්න පැහැදිළිව සඳහන් කළ යුතුයි.

7. රජයේ ප්‍රවෘත්ති පළවන ගැසට් පත්‍රයේ I වැනි සහ II වැනි ඡේදයේ පළවන රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම් වලට අදාලවූද පොදු කොන්දේසි මෙම පත්වීම කෙරේද බලපාන්නේ ය.

එන්. පී. විජයරත්න,
අනුරාධපුර දිසාපති.

1960 මැයි මස 2 වෙනි දින,
අනුරාධපුර දිසාපති කාර්යාලයේ දී ය.

### ආදශී ආකෘති පත්‍රය

**පිටපත් කරුගේ තනතුර**

1. සම්පූර්ණ නම, ජාතිය සහ ලිපිනය :————.

2. * උපන් දිනය සහ උපන් ස්ථානය—

(අ) අයදුම් කරු (ලියා පදිංචි කිරීමෙන් නම් ලියා පදිංචි කිරීමේ සහතිකයේ අංකය සඳහන් කරන්න.) :————.

(ආ) අයදුම් කරුගේ පියා :————.

(ඉ) අයදුම් කරුගේ සීයා (පිය පාර්ශ්වයේ) :————.

(ඊ) අයදුම් කරුගේ සීයාගේ (පිය පාර්ශ්වයේ) පියා :————.

3. අධ්‍යාපනික සුදුසුකම් (දින සහ විස්තර සහිතව) :————.

4. පාසැලෙන් අස්වූ දින සිට මේ දක්වා කර ඇති රක්ෂාවල් : කාල සීමාවක් සහිතව සහ දැනට ලැබෙන වේතනය (දැනට ලැබෙන වේතන ක්‍රමයද සඳහන් කරන්න.) :————.

5. ඉදිරිපත් කොට ඇති චරිත සහතිකයන්ගේ ගණන :————.

6. අයදුම් කරුගේ චරිතය සම්බන්ධයෙන් පහසුවෙන් තොරතුරු සොයා ගත හැකි අයවළුන් දෙදෙනකුගේ නම් සහ ලිපිනයන් සහ ඔවුනගේ තරා තිරම :————.

————,
අයදුම් කරුගේ අත්සන.

දිනය :————.

* අයදුම් කරු ලංකාවේ උපන් අයෙක් නම් "ආ" හෝ "ඉ, ඊ," හෝ යන දෙකින් එකක් පිරවිය යුතුයි. අයදුම් කරු ලංකාවේ උපන් අයකු නොවේ නම්, "ආ සහ ඉ" හෝ "ඉ සහ ඊ" හෝ යන දෙකෙන් එකක් පිරවිය යුතුයි.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### වෛද්‍ය රසායනාගාර කාර්මිකයන්ගේ විභාගය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය රසායනාගාර කාර්මික සේවයේ II වැනි පෙළට ඇතුළත් වීම සඳහා පුහුණුවීමට කැමති ගැහැණු හා පිරිමි යන දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 1960 මැයි 31 වැනි දිනට පෙර ලියාපදිංචි කළ තැපෑලෙන් මා වෙත එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයෙහි රු. 10 වටිනා මුද්දර අලවා අත්සන් යොදා එය අවලංගු කළ යුතු ය. කිසිම කරුණක් සඳහා මුද්දරවල වටිනා කම ආපසු ගෙවනු නොලැබේ.

2. **වැටුප් ක්‍රමය :** වෛද්‍ය රසායනාගාර කාර්මිකයන්ගේ සේවයේ වැටුප් ක්‍රමය පහත දැක්වෙන පරිදි වේ:—

විශේෂ ශ්‍රේණිය : රු. 4,800—180 ඒවා 3 සහ 240 ඒවා 1—5,580.

i වැනි ශ්‍රේණිය : රු. 2,940—120 ඒවා 8 සහ 180 ඒවා 4—4,620.

ii වැනි ශ්‍රේණිය : රු. 1,020—120 ඒවා 15—2,820—(රු. 1,500 සහ 2,220 වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් වෙත්)

3. **සේවා කොන්දේසි :** (i) පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ප්‍රථමයෙන් පත්වීම දෙනු ලබන්නේ අවුරුදු තුනක සෝදිසි කාලයකට ය.

(ii) තෝරාගනු ලැබූ ගැහැණු අයදුම්කරුවන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක විය යුතුය.

(iii) තෝරාගත් අයදුම්කරුවන් අවුරුද්දක් පුහුණුවූ පසු ලිඛිත ප්‍රශ්න පත්‍ර හා ප්‍රායෝගික ප්‍රශ්න ඇතුළු අවසාන විභාගයකින් සමත් විය යුතු ය. මෙම විභාගයෙන් අසමත් වන අයදුම්කරුවන් අස්කිරීමට ඉඩ ඇතත් විභාගය ගැනීමට තවත් අවස්ථා දෙකක් ලබාදෙනු ලැබේ. සමත්වූ අයදුම්කරුවන්ට වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාව පිළිබඳ ප්‍රවීණතා දැක්වෙන සහතිකයක් නිකුත්කර වෛද්‍ය රසායනාගාර කාර්මිකයන්ගේ II වැනි ශ්‍රේණියට පත්කරනු ලැබේ. තුන් වසක සෝදිසි කාලසීමාවක් යටතේ කෙරෙන මේ පත්වීම් දෙනු ලබන්නේ ඇබැර්තු ඇතිවන පරිදි ය.

(iv) තෝරාගත් අයදුම්කරුවන් පුහුණුවීමේ පන්තියට ඇතුළත් වූ දින සිට අවුරුදු 7 ක කාලයක් දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත් එසේ නැතහොත් පුහුණුවීමේ කාලය තුළ දී ලැබූ වැටුප් හා සියලුම දීමනා ආපසු ගෙවන බවටත් ඇපයක් සහිත ගිවිසුමකට බැඳිය යුතු ය.

(v) පුහුණුවන කාලසීමාව තුළ දී මසකට රු. 75ක ආධාර මුදලක් ගෙවනු ලැබේ.

(vi) වෛද්‍ය රසායනාගාර කාර්මිකයන්ගේ III වැනි ශ්‍රේණියේ හා රසායනාගාර උප සහායකයන්ගේ සේවාවන්ගෙන් තෝරාගත් අය පුහුණුවීමේ කාලයේ දි වැඩ බැලීමට පත්කර මෙහි III වැනි ඡේදයෙහි සඳහන් විභාගයෙන් සමත්වූ විට පත්වීම ස්ථිර කරනු ලැබේ. විභාග යෙන් අසමත් වූවත් නැවත ඔවුන්ගේ පළමු තනතුරුවලට යවනු ලැබේ.

(vii) වෛද්‍ය රසායනාගාර කාර්මිකයන් දින 7 තේ සේවකයන් බැවින් රජයේ නිවාඩු දින හා ඉරිදා දින ඇතුළු සතියේ සෑම දිනකම වැඩ කළයුතු ය. සතියේ සත් දින තුළ දවාලේ හෝ රාත්‍රියේ ඕනෑම වේලාවක් සේවයට කැඳවූවහොත් පැමිණීමට සූදානම්ව සිටිය යුතුය.

(viii) තෝරාපත්කරගත් අපේක්ෂකයෝ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස ද විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාවෙහි යෙදීම පිණිස ද දැනට පනවා ඇති හෝ මතුවට පනවනු ලබන හෝ කිසියම් ව්‍යවස්ථාවක් වෙතොත් ඊට අනුකූලව ක්‍රියා කළ යුත්තාහ.

(ix) තෝරාගත් අපේක්ෂකයෝ සෝදිසි කාලය තුළ දී සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුත්තාහ. ඔවුන්ගේ තනතුරු ස්ථිර කරනු ලබන්නේ වෙනත් කරුණු ඇතුළුව සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා විභාගයකින් ද සමත් වීමෙන් පසුවය.

(x) සෝදිසි කාලය තුළ දී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයකට එළඹිය නොහැකි වූවන්ගේ සේවය නවතාලීමට ඉඩ තිබේ. එහෙත් රාජ්‍ය භාෂාව ඉගෙනීමෙහි ලා නිර්ව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැයි පත්වීම් දෙනු ලබන අධිකාරීන්ට ඒත්තු ගියහොත් සේවය නවතාලීම කල් තැබිය හැකි ය. නියමිත දිනට පසුව සැහෙන කාලසීමාවක් ඇතුළත ආධුනිකයා එම පරීක්ෂණයෙන් සමත් වුවහොත් බලාධිකාරීන්ගේ අභිමතය පරිදි ඔහුගේ ජ්‍යෙෂ්ඨත් වයෙන් පහළ යාම ද වෙනස් කරනු ලැබේ.

(xi) සිංහල භාෂා මාධ්‍යයෙන් රජයේ සේවයට බැඳෙන නිලධාරීන් සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

**සංලක්ෂ්‍යය**—(අ) වෛද්‍ය රසායනාගාර කාර්මික සේවයට බඳවා ගනු ලබන විට ආදි ප්‍රවේශකයන් වශයෙන් ගැණෙන අය මෙහි (viii), (ix) හා (x) යන අනුඡේදවලට අයත් ආවශ්‍යකතාවයන්ගෙන් කරනු ලැබේ.

(ආ) 1956.9.24 වැනි දිනට පෙර සිට ස්ථිර සේවයට බැඳී සිටි රසායනාගාර උප සහායකයන් හා III වැනි ශ්‍රේණියේ වෛද්‍ය

රසායනාගාර කාර්මිකයන් වෛද්‍ය රසායනාගාර කාර්මික සේවයේ II වැනි ශ්‍රේණියට තෝරා ගතහොත් ඔවුන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව ආදි ප්‍රවේශකයන් වශයෙන් සලකනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම් :** (I) සෑම අයදුම්කරුවකුට ම පහත සඳහන් සුදුසුකම් ඇති බැව් ඔප්පු කළ යුතු ය :—

(අ) 1960 මැයි 31 වැනි දිනට වයස අවුරුදු 17 කට නොඅඩු බව හා අවුරුදු 25 කට නොවැඩි බව ;

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත් වී ඇති බව. මේ විභාගයේ දී රසායන විද්‍යාවෙන් සම්මාන සාමාර්ථය ද භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව හා ජීව විද්‍යාව යන මින් එකකින් සාමාන්‍ය සාමාර්ථය ද ලබා සිටිය යුතුයි.

(ii) රසායනාගාර උප සහායකයන් හා III වැනි ශ්‍රේණියේ වෛද්‍ය රසායනාගාර කාර්මිකයන් යන තනතුරු දරන අය නම්, පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකයෙන් සමත්ව ඇති බව හා අවුරුදු 3ක් සතුටුදායක ලෙස සේවය කර ඇති බව ;

(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ III වැනි ශ්‍රේණියේ වෛද්‍ය රසායනාගාර කාර්මිකයෙක් නම්, එම සේවයේ අවුරුදු 5ක් සතුටුදායක අන්දමින් සේවය කර තිබෙන බව ;

5. අයදුම්කරුවන් සිය අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් (මේ සඳහා බව්තීස්ම සහතික හා අධ්‍යාපන සංග්‍රහය යටතේ ආධාර ලබන පාඨශාලාවලට ශිෂ්‍යයන් ඇතුළු කිරීම සඳහා නිකුත් කරනු ලබන සහතික පිළිගනු නො ලැබේ.)

(ආ) ලබා ඇති උසස් ම අධ්‍යාපන සහතිකයේ පිටපතක්.

(ඉ) අයදුම්කරුගේ සුදුසුකම, චරිතය, හා මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතා ආදිය දක්වෙන මෑතදී ලබාගත් සහතික 3 ක් (දැනට රජයේ සේවයේ සිටින්නන් විසින් මේ සහතික ඉදිරිපත් කළ යුතු නොවේ.)

**සංලක්ෂ්‍යය :** සහතිකවල පිටපත් අයදුම්කරුට ආපසු එවනු ලැබේ.

6. 1960 ජූලි මස 18 වැනි දින කොළඹ දී පැවැත්වෙන තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව ආධුනිකයන් තෝරාගනු ලැබේ. ඒ විභාගයට පහත සඳහන් විෂයයෝ ඇතුළත් වෙත් :—

| | | ලකුණු |
|---|---|---|
| (1) | භාෂාව හා රචනය (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) ... | 100 යි. |
| (2) | *සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) ... | 150 යි. |
| (3) | †සාමාන්‍ය විද්‍යාව (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) ... | 200 යි. |
| (4) | සරල මාතෘකාවක් යටතේ ඉංග්‍රීසියෙන් කෙරෙන රචනයක් (පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍රයේ තත්ත්වයට පිළියෙල කෙරෙන මෙම විෂයයට ඉංග්‍රීසි මාධ්‍යයෙන් විභාගයට පිළිතුරු නොසපයන සියල්ලන් විසින්ම උත්තර සැපයිය යුතු ය. මෙම ප්‍රශ්න පත්‍රයට සියයට 40ක් ලකුණු නොලබන කිසිවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු නොලැබේ. එහෙත් මේ පත්‍රය සඳහා ගනු ලබන ලකුණු ආධුනිකයින්ට පත්වීම් දීමේදී තත්ත්වය මැනීම සඳහා ප්‍රයෝජනයට ගනු නොලැබේ.) ... | 100 යි. |

* සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය එකතු කිරීම (TOTS) සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම යන කොටස් තුනකින් යුක්ත වේ.

† සාමාන්‍ය විද්‍යා ප්‍රශ්න පත්‍රයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයයන් පිළිබඳ අයදුම්කරුගේ දැනුම පරීක්ෂා කෙරේ. රසායන විද්‍යාව පිළිබඳ ප්‍රශ්න පත්‍රය අනිවාර්ය වන අතර, භෞතික විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ සත්ව විද්‍යාව යන එක විෂයයකට අයත් ප්‍රශ්නවලට අයදුම්කරු විසින් පිළිතුරු සැපයිය යුතු ය. මේ ප්‍රශ්න පත්‍රය පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාග තත්ත්වයේ එකකි.

**විභාගය පැවැත්වෙන භාෂා මාධ්‍යය :** අයදුම්කරුවන් මෙම විභාගයට සුදුස්සන් වීම සඳහා සමත්වී විභාගයට පිළිතුරු සැපයූ භාෂා මාධ්‍යයෙන් (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) මේ විභාගයටද පිළිතුරු සැපයිය යුතු ය.

(අ) විභාගයට ඇතුළත්වීමට සුදුස්සෙකු වීම පිණිස සමත්වී ඇති විභාගයේ දී නොයෙක් විෂයයන් සඳහා භාෂා මාධ්‍ය කීපයකින් පෙනී සිට ඇත්නම් මෙම විභාගයේදී ද ඒ විෂයයන්ට ඒ ඒ භාෂා මාධ්‍යයන්ගෙන් උත්තර සැපයිය හැකි ය. ඒ හැරුණුවිට අන් විෂයයන්ට භාෂාව හා වාක්‍ය රචනයට (1 ප්‍රශ්න පත්‍රයට) පිළිතුරු සපයන භාෂා මාධ්‍යයෙන් උත්තර සැපයිය යුතු ය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් හා සතර වැනි ඡේදයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් ගැන නොසලකා මෙම විභාගයට පෙනී සිටීමට අවසර දී ඇති දෙපාර්තමේන්තුවේ සේවය කරන අයදුම්කරුවන් තමා අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයන්ගෙන් විභාගයට පෙනී සිටිය යුතු ය.

(ඉ) අධ්‍යාපන සුදුසුකම් ලැබූ විභාගවලට දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් වූ අය හා දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් ඉගෙනීම ලැබූ අය කැමති නම්, මේ විභාගයට සිංහල මාධ්‍යයෙන් පෙනී සිටීමට ඉඩ ඇත.

7. **හැඳින්වීමේ පත්.**—විභාග ශාලාව භාර නිලධාරිවරයාට පිළිගත හැකි අන්දමේ හැඳින්වීමේ පත් සෑම අයදුම්කරුවකු ළඟම තිබිය යුතු ය. මේ සඳහා මෙහි පහත සඳහන් කවර ලියවිල්ලක් වුව ද ප්‍රමාණවත් වේ :—

(අ) තැපැල්පති විසින් නිකුත් කරනු ලබන හැඳින්වීමේ පත්‍රයක් ;

(ආ) විභාග පැවැත්වෙන දිනට අවුරුදු 3ක් නොඉක්මවූ පාස්පෝට් බලපත්‍රයක් ;

(ඉ) විභාගය පැවැත්වෙන දිනට අවුරුදු 3ක් නොඉක්මවූ අයදුම්කරුගේ ඡායාරූපය සහිතව රජයේ දෙපාර්තමේන්තුවක අවසරය ඇතිව නිකුත් කෙරෙන සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

8. ලිවීමේ විභාගයේ දී සතුටුදායක තත්ත්වයකට එළඹෙන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය යනාදී තොරතුරු එක් එක් අයදුම්කරුවාට පසුව දන්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් මගිනි. ගමන් ගාස්තු හෝ වෙනත් වියදම් ආදියක් ගෙවනු නොලැබේ.

9. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ වෙනත් ලිපි ලේඛන ආදිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, කොළඹ, කියා එවිය යුතු ය. ඒවා කිසි විටෙකත් මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියකුගේ පුද්ගලික ලිපිනයට එවිය යුතු නොවේ.

10. මේ දැන්වීමෙහි දැක්වෙන අන්දමට පිළියෙල නොවූ අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළවෙන රාජ්‍ය සේවා පත්වීම් පිළිබඳ පොදු කොන්දේසි අයදුම්කරුවන් විසින් කියවා තේරුම් ගත යුතු ය.

සී. පොන්නම්බලම්,
වැඩබලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1960 මැයි මස 13 වැනිදා,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
තැ. පෙ. 500,
කොළඹ.

## ආකෘති පත්‍රය

### II වැනි ශ්‍රේණියේ වෛද්‍ය රසායනාගාර කාර්මිකයන්ගේ සේවයට බැඳීමට කරන ඉල්ලීම

1. (අ) සම්පූර්ණ නම :————.
(ආ) ලියුම් ලැබෙන පිළිවෙල :————.

2. (අ) 1960 මැයි 31 වැනිදට සම්පූර්ණ වයස :——අවු :——මාස :——දින :————.
(ආ) උපන් දිනය හා ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

3. ජාතිය :————.

4. විවාහකද අවිවාහකද යන වග :————.

5. සුදුස්සකු වීම සඳහා සමත්වී ඇති විභාගය—විභාග දිනය, අංකය හා මධ්‍යස්ථානයත් සමත්වූ විෂයනුත් සඳහන් කළ යුතුයි.

6. පාඨශාලාවෙන් අස්වූ පසු යෙදුන රක්ෂාව :————.

7. විශේෂ පුහුණුවක්, පළපුරුද්දක් හෝ සුදුසුකමක් තිබේ ද යන වග :————.

8. චරිතය පිළිබඳ සහතික ලබාගත් අයගේ තනතුරු :————.
(නෑදෑයින්ගේ සහතික භාරගනු නොලැබේ).

9. විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යය :————.
(අ) භාෂාව හා රචනය :————.
(ආ) සාමාන්‍ය දැනීම :————.
(ඉ) සාමාන්‍ය විද්‍යාව :————.

මේ අයදුම් පත්‍රයෙහි දක්වා ඇති විස්තර සත්‍ය බවට මම සහතික කරමි. මෙහි සඳහන් කළ යම්කිසි තොරතුරක් විභාගයට පෙනීසිටීමට පෙර අසත්‍ය බව හෙළිවුවහොත් නුසුදුස්සකු වන බවත්, පත්කර ගැනීමෙන් පසුව හෙළිවුවහොත් රක්ෂාවෙන් නෙරපනු ලබන බවත් මම දනිමි.

රුපියල් 10 ක මුද්දරය
අයදුම්කරු මුද්දරය මත අත්සන් කළ යුතුය.

දිනය :————.

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### උප ශාඩ්වරුන් බඳවා ගැනීම—1960

උප ශාඩ්වරුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් අංක 12,061 සහ 1960 පෙබරවාරි මස 12 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළමුවැනි කොටසේ දෙවෙනි ඡෙදයෙහි පළකරන ලද දන්වීම පිළිබඳවයි. 1960 මැයි 21 වෙනි දින පැවැත්වීමට නියමව තිබූ විභාගය 1960 ජූනි මස 4 වෙනිදාට කල් දමා ඇත.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

1960.5.3 වෙනි දින,
කොළඹ, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේදීය.

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන විසින්, තැපැල් ලිපිනය : 500 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1, ගැල්වනයිස් වානේ කටු කම්බි සහ කම්බි කොකු ඇණ සැපයීම සඳහා 1960 ජූලි 12 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩරකරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ජූලි 11 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර ෆෝරම කොළ දෙනු ලැබේ.

විදෙශීය ටෙන්ඩරකරුවන් සඳහා විශෙෂ ටෙන්ඩර ෆෝරම සකස් කර තිබේ. රු. 100ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී ෆෝරම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර ෆෝරම කොළදැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 මැයි 13 වැනිදා,
කොළඹදීය.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මොණරාගල උප කොට්ඨාශයේ කෝන්ගහ වැව තැනීම සඳහා එවන ටැන්ඩර් පත්‍ර කොළඹ මහ ලේකම් ගොඩනැගිල්ලේ 355 වැනි කාමරයෙහි වූ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ජූනි මස 28 වැනි අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

වාරිමාර්ග හෝ දුම්රිය හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 75,000කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩ සඳහා ඉල්ලුම් කළ හැක.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 100ක් කොළඹ වාරිමාර්ග අධ්‍යක්ෂතුමාගේ කායඹාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ජූනි මස 24 වැනි සිකුරාදා දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර බණ්ඩාරවෙල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන ගෙන් ලබාගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂක වෙනුවට.

1960. 4. 11.
කොළඹ.

## වාරිමාගී දෙපාර්තමේන්තුව

මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් 1960 ජූනි මස 15 වෙනි බදාදා පෙරවරු 10 වනතෙක් පහත සඳහන් වැඩ සඳහා වාරිමාගී දෙපාර්තමේන්තුවේ, ඒ ඒ වැඩ සඳහා ඉදිරියෙන් සඳහන්වන මුදල් ප්‍රමාණයන් අනුව ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් ගෙන් සීල් තබනලද ටෙන්ඩර් කැඳවනු ලැබේ. 1960.6.15 වෙනි දින පෙරවරු 10.30 ට මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් ටැන්ඩර් විවෘතකරනු ලැබේ. එම අවසථාවේ ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

| වැඩ පිළිබඳ විස්තරය | ලියා පදිංචි ප්‍රමාණය | ටැන්ඩර් අත්තිකාරම් මුදල |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| (1) නුවරඑළියේ කම්කරු නිවාස තැනීම ... ... | 15,000 | 25 |
| (2) මහනුවර දිස්ත්‍රික්කයේ කිරින්දේ තලගහමුල්ල ඇල අළුත් වැඩියා කිරීම ... | 5,000 | 25 |

මහනුවර වාරිමාගී ඉංජිනේරු තැන විසින් ටැන්ඩර් නිකුත්කරනු ලබන්නේ, 60.5.13 දින සිට 60.6.13 වෙනි දින දක්වා පමණී. මෙම ටැන්ඩර් එවිය හැක්කේ මෙම දෙපාර්තමේන්තුවේ ඉහත ඒ ඒ වැඩ ඉදිරියේ සඳහන්ව ඇති මුදලට හෝ ඊට වඩා ලියාපදිංචි වී ඇති බව ඔප්පු කළ කොන්ත්‍රාත් කරුවන්ට පමණී. ටැන්ඩර් ෆෝරම වලට ගෙවිය යුතු අත්තිකාරම් මුදල් කච්චේරියේ හෝ මහනුවර වාරිමාගී ඉංජිනේරු කායඹාලයේ තැන්පත්කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. කිසිම විමසීමක් නැතිව ඕනෑම ටැන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන් පිළිගැනීමේ හෝ සියළුම ටැන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුය.

ටැන්ඩර් කරුවන් ඔවුන්ගේ ටැන්ඩර් එවා විවෘත කළ දින සිට සති තුනක් යනතුරු තමන්ගේ ගණන් හිලව් නොවෙනස්ව තබා ගත යුතුය.

වැඩි විස්තර මහනුවර වාරිමාගී ඉංජිනේරු කායඹාලයෙන් ලබාගත හැක.

ඇස්. ටී. කන්දයියා,
වාරිමාගී ඉංජිනේරු තැන,
මහනුවර.

## වාරිමාගී දෙපාතීමේන්තුව

### ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තුමාගේ කායඹාලය තැනීම

පොළොන්නරුවේ ඊසාන දිශාව භාර ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තුමා විසින් පොළොන්නරුවේ නව නගරයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ කායඹාලය තැනීම සඳහා 1960ක්වූ මැයි මස 25 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

2. පොළොන්නරුවේ වාරිමාගී කායඹාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර්පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. සැලැස්ම සහ වැඩ පිළිබඳ විස්තර පොළොන්නරුවේ වාරිමාගී කායඹාලයෙන් ලබා ගත හැක.

3. වාරිමාගී දෙපාතීමේන්තුවේ රුපියල් 45,000කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචිවී ඇති රුපියල් 50 කච්චේරියේ හෝ මෙම කාර්යාලයේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවනට 1960ක්වූ මැයි මස 9 වැනි දින සිට මැයි 23 වැනි දින දක්වා ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත්කරනු ලැබේ.

4. දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත්කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතික පත්‍ර, ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටීමට කැමති කොන්ත්‍රාත්කරුවන් 1960ක්වූ මැයි මස 25 වැනි දින පෙරවරු 9.30ට ඊශාන දිශාව භාර ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරුතුමාගේ කායඹාලයට පැමිණිය යුතුයි.

කේ. ඩී. පී. පෙරේරා,
වාරිමාගී ඉංජිනේරු තැන,
පොළොන්නරුව උප කොඨාශය.

1960.5.2,
පොළොන්නරුව.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### නාවල අඹගහවත්ත "බී" වගීයේ ගෙවල් 2ක් තැනීම

නාවල අඹගහවත්ත "බී" වගීයේ ගෙවල් 2ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 ජූනි මස 17 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානාත්‍ය ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 60,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 60ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 ජූනි මස 15 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩ්,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1960 මැයි මස 4 වෙනි දින,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.

---

## ලුණු දෙපාර්තමේන්තුව

### මේස ලුණු ඇසිරීම සඳහා තුනී කාඩ්බෝඩ් පෙට්ටි (ඇතුළත පොලිතීන් කවරය සහිතව) සැපයීම

වෂී 1960 ජූලි මස 1 වැනි දින සිට 1961 ජූනි 30 වැනි දින දක්වා මේස ලුණු ඇසිරීම සඳහා තුනී කාඩ්බෝඩ් පෙට්ටි (ඇතුළත පොලිතීන් කවරය සහිත) 2,00,000ක් සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ කොම්පඤ්ඤවීදියේ ජෙනරල්ස් ලේක් පාරේ අංක 110, තැපැල් පෙට්ටිය නෝ. 539 දරණ ලුණු කොමසාරිස් තැන විසින් 1960 ජූනි 3 වැනි සිකුරාදා පස්වරු 3 වනතුරු භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනුපිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ ඇලිෆන්ට් පාස් ලුණු අධිකාරිතැන ගෙන් ලබාගන්නා පෝර්ම කොළවලය. ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 100ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටැන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ලුණු කොමසාරිස්තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස්.

අංකය : ඊ. ජී. 150.
1960 මැයි මස 13 වැනි දින,
කොළඹ.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය "ටෙන්ඩර් බෝඩ්" මණ්ඩලයේ සභාපතිතැන විසින් මසකට කියුබ් 100 බැගින් අඟල් 1 1/2 කළුගල් කියුබ් 700 ක් කොණ්ඩාවිල් දුම්රියපළ අසළ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, 1960 ජූනි මස 10 වෙනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැක.

කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාගී හා වැඩ පිළිබඳ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. අංක 370) මේ සඳහා පෝර්ම කොළ ලබාගෙන, ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියලු විස්තර මෙම නිලධාරි තැන ගෙන් ලබාගත හැක.

වෂී 1960 මැයි මස 27 වෙනි සිකුරාදා පස්වරු 4 දක්වා, ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත, ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 50 හා ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද තැන්පත් කර ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේදීය.

ටෙන්ඩර් පත්‍ර කවරයක බහා, මුද්‍රා තබා එහි වම් පස උඩ කෙළවරෙහි "මසකට කියුබ් 100 බැගින් අඟල් 1 1/2 කළුගල් කියුබ් 700 ක් කොණ්ඩාවිල් දුම්රියපළ අසළ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර" යන්න සඳහන්කර, ලියා පදිංචි කළ තැපෑලෙන් 1960 ජූනි මස 10 වෙනි සිකුරාදා පස්වරු 2.30ට පෙර ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය "ටෙන්ඩර් බෝඩ්" මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි. ස්වකීය ටෙන්ඩර් පත්‍රය තැපැල් මගින් එවීමට අකමැතිනම් එය ඉහත සඳහන් කාර්යලායේ ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට බලය ලත් නිලධාරි යෙකුට නියමිත වේලාවට පෙර භාරදී කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. අංක 370,
කොළඹ, 6.5.60.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ඩීසල් දුම්රිය ඇන්ජින් දෙකක් සැපයීම

ඉහත සඳහන් සැපයීම සඳහා 60. 4. 20 වෙනි දින තෙක් භාර ගන්නා ලද ටෙන්ඩර් පත්‍ර අවලංගු කළ බව ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි. ප්‍රතිශෝධිත විස්තර පත්‍රිකාවකට අනුකූල ටෙන්ඩර් පත්‍ර යථා කාලයේදී කැඳවනවා ඇත.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1960 මැයි මස 5 වෙනි දින,
කොළඹ වරාය කොමිෂන් කායඝාලයේදීය.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 මැයි මස 26 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා, පාවිච්චි කළ නොහැකි බඩු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1960 මැයි මස 26 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ බවට එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්‍ෂා කළ හැක. රු. 25 ක මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොලවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 මැයි මස 25 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ. තෝරා ගත් ටෙන්ඩර් කරු විසින් පාවිච්චි කළ නොහැකි බඩු වරාය කොමිෂන් සීමාවෙන් ඉවත් කිරීමට ප්‍රථමයෙන් රේගුවේ දෙපාර්තමේන්තුවට අය විය යුතු තීරු බද්ද ගෙවිය යුතුය.

අ. න. සි. කුලසිංහ,
වරායේ කොමසාරිස් වෙනුවට.

1960 මැයි මස 6 වෙනි දින,
කොළඹ, වරාය කොමිෂන් කාර්යාලයේදීය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

අනුරාධපුර නව නගරයේ ලංගම ඩිපෝවෙහි ඇතුළත වැටවල් හා පිටත වැටවල් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් භාරගනු ලැබේ.

1960 වේ මැයි මස 25 වෙනි දින පෙ. ව. 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නවත්වනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සෝ නම් රු. 20,000 ක් හෝ ඊට වැඩියෙන් වියදම් යන වැඩ කිරීමට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවෝ පමණකි. ඔවුන් විසින් තම සහතික පත්‍ර ආදිය බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලීය සිවිල් ඉංජිනේරු මහතා වෙත පරීක්‍ෂාව පිණිස ඉදිරිපත් කළ යුතුයි. ඒවා පිළිගත හොත්, කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත ඔවුන් විසින් රු. 100 ක ටෙන්ඩර් මුදලක් තැන්පත් කළ යුතුයි. ටෙන්ඩර් ලිපි දිය හැක්කේ ඉන් පසුවය.

ටෙන්ඩර් පත්‍ර ලියා එවිය යුත්තේ "ලංගමයෙන්" දෙන ටෙන්ඩර් පෝරම කොළවලය. ඒ පෝරම කොළ යටකී සිවිල් ඉංජිනේරු මහතා විසින් 1960 වේ මැයි මස 21 වෙනි ද දවල් 12 වන තෙක් නිකුත් කරනවා ඇත. වැඩි විස්තර ඒ මහතාගෙන් දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1960.5.6
200, කිරුළ පාර, කොළඹ 5.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

රත්නපුර සීවලී මහා විද්‍යාලයේ ළිඳක් කැනීම, වතුර ටැන්කියක් සහ ඇන්ජින් කාමරයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 ජූනි මස 1 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. රත්නපුර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 මැයි මස 27 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 12,500ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960. 5. 6.

---

තාලන්ද දිස්ත්‍රික්කයේ පූවක්පිටිය-වැලම්ටියාව පාරේ පස්වෙනි සැතපුම තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 ජූනි මස 15 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහනුවර, අස්ගිරියේ ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 මැයි මස 27 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ මාගී වැඩ සඳහා රුපියල් 45,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ජේ. ඩබ්ලිව්. ද අල්විස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960. 5. 6.

---

කොළඹ මැනින් වෙළඳ පොළේ අතිරේක ආහාර ගබඩාවක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 ජූනි මස 15 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරින්ටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ නැගෙනහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 මැයි මස 27 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 55,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960. 5. 6.

---

මල්දෙනියේ මධ්‍යම දිස්පැන්සරිය හා වෛද්‍ය නිලධාරියාගෙ නිවාසය සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 ජූනි මස 15 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පතන, දිඹුල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 මැයි මස 27 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 75,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ

ලියකියවිලි සහ (ආ) ටෙන් ඩර් තැන් පත් මුදල වන රු. 100 ක් තැන් පත් කර ලබාගත් කුවිතාන් සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන් ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන් ඩර් තැන් පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූප්‍රකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ් ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝප්පරේෂන් ".

(ඇ) ග්‍රාමසංවර්ධන අධ්‍යක් ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස් ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන් ඩර් සඳහා තැන් පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන් තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන් පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ් ඩුවේ වැඩ දෙපාර්තමේන් තුවේ
අධ්‍යක් ෂක වෙනුවට.

කොළඹ, ආණ් ඩුවේ වැඩ දෙපාර්තමේන් තුවේ
කාර්යාලයේ දීය, 1960. 5. 6.

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් සඳහා ගත් අවසාන තීරණ

**1. 4. 60 සිට 30. 6. 60 දක්වා**

| ටෙන්ඩර කැඳවීමේ කාරණය | ටෙන්ඩර්කරුවන්ගේ නම් | විෂය පිළිගත් ගණන් | තෝරාගත් ටෙන්ඩරකරුගේ නම |
|---|---|---|---|
| 1.4.60 සිට 30.6.60 දක්වා හරක් මස් සැපයීම | (1) ඇම්. ඒ. ඇස්. මොහමඩ් මුස්තාපා ...<br>(2) ඇස්. ඊ. සිල්වා ...<br>(3) පී. දෙන්. ජෙරමියස් ... | (1) ඇටකටු සත 05 ...<br>(2) සියයට 25ක් කටු සමඟ සත 78<br>(3) පස්සගාත් සත 78<br>(4) කටු සහිතව කපන ලද මස් කැබලි සත 75<br>(5) වකුගඩු රු. 1·05<br>(6) පීකුදු රු. 2·45<br>(7) මොළය ශත 83<br>(8) සට්ටම් සහ තුනටි මස් සත 78<br>(9) සට්ටම් මස් සත 78<br>(10) යටින් කපන ලද තුනටි කැල්ල සමග සත 78<br>(11) මැදින් කපන ලද තුනටි කැල්ල සමග සත 78<br>(12) ඉස්ටු මස් සත 80<br>(13) සුප් මස් සත 55<br>(14) ඇටකටු සහිත කෙණ්ඩා මස් සත 55<br>(15) ඇට කටු රහිත එම මස් සත 80<br>(16) බැදුමට සුදුසු සත මස් සත 85<br>(17) තැම්බීමට සුදුසු එම මස් සත 85<br>(18) වලිග සත 60<br>(19) දිව සත 60<br>(20) බොකු සහ කිරි බඩ වැල් සත 15<br>(21) හදවත සත 95<br>(22) ඇටකටු රහිත හරක් මස් සත 94<br>(23) වහුපැටවුන්ගේ මස් සත 75<br>(24) යටපැත්තේ මස් රු. 1·10 | ඇම්. ඒ. ඇස්. මොහමඩ් මුස්තාපා, 95, විවේකානන්ද හිල්, කොළඹ 13 |
| 1.4.60 සිට 30.9.60 දක්වා බටර් සැපයීම | (1) ඇම්. මානියම් ස්ටෝර්ස්<br>(2) සී. ඩබ්ලිව්. ඊ. මැක්ලම් පාර<br>(3) ඒ. ඇම්. බුහාරි සහ පුත්‍රයෝ<br>(4) සීමාසහිත ජී. සී. රෝච් සහ සමාගම | | |
| (1) මරදානේ ට්‍රිපොලියෙහි පිහිටි ආරෝග්‍ය ශාලාවට කෑම සපයන අංශයට<br>(2) මරදානේ ට්‍රිපොළි වෙළඳසැලට, බොරැල්ලේ පිහිටි බේකරියට සහ මුළුතැන්ගෙට, කොටුවේ වැතැම් වීථියේ තිබෙන සිල්ලර බඩු ගබඩාවට සහ එහි ඇති කැන්ටිමට | | රාත්තල රු. 2·44 බැගින් ගෙනැවිත් භාරදීමට | සීමාසහිත ජී. සී. රෝච් සහ සමාගම, මැලිබන් වීථිය, පිටකොටුව. |

| ටෙන්ඩර කැඳවීමේ කාරණය | ටෙන්ඩරකරුවන්ගේ නම | විෂය පිළිගත් ගණන් | තෝරාගත් ටෙන්ඩරකරුගේ නම |
|---|---|---|---|
| (1) කොළඹින් පිට පිහිටි රජයේ රෝහල් වලට<br>(2) ස්වදේශිය භාණ්ඩ මිලදීගැනීමේ සහ විකිණීමේ සාප්පු වලට | | රාත්තල රු. 2·55 බැගින් ගෙනැවිත් භාරදීමට | ඒ. ඇම්. බුහාරි සහ පුත්‍රයෝ, 27, වෙල් වීථිය, කොළඹ |
| 1960 ජූනි 30න් අවසන්වන කාලය දක්වා අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ ආයතනවලට පොල් සැපයීම | (1) වී. ජේ. එච්. දනපාල මයා.<br>(2) ඩී. වික්‍රමරත්න මයා. | | ඩී. වික්‍රමරත්න මයා., 212/53, ගැස් වීථිය, පිටකොටුව. |
| මරදනේ ට්‍රිපොළියට | | (1) ගෙඩිය අවුන්ස 30 සහ වැඩියෙන් බරැති පොල් 1,000 රු.230 බැගින් හෝ දිනපතා ප්‍රවෘත්ති පත්‍රයේ පළකල පරිදි වෙළඳ පොලේ දවස් පතා පවතින කොප්පරා පාරමක ඉහළම මිලට රු. 13 ක් අඩුවෙන් හෝ යන මේ දෙකෙන් අඩු එක<br>(2) ගෙඩිය අවුන්ස 26 ටත් 30ටත් අතර බරැති පොල් 1,000 රු. 197·50 බැගින් හෝ දිනපතා ප්‍රවෘත්ති පත්‍රයේ පළවූ පරිදි වෙළඳ පොලේ දවස් පතා පවතින කොප්පරා පාරමක ඉහළම මිලට රු. 44ක් අඩුවෙන් හෝ යන මේ දෙකෙන් අඩු එක | |
| බොරැල්ලේ මූළුතැන්ගෙට ... | | වටප්‍රමාණය අඟල් 12ට අඩු නුවූ අවුන්ස 26ටත් 30ටත් අතර බරැති පොල් 1,000 රු. 174·50 බැගින් ගෙනැවිත් භාරදීමට | වී. ජේ. එච්. දනපාල මයා., දනනිවස, ගම්පහ |
| 1.2.60 සිට 15.2.60 දක්වා අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව සතු ආයතනවලට කුළු බඩු සැපයීම | (1) සිවම් ස්ටෝර්ස් ... | සුදුළුනු හොණ්ඩරය රු. 50 බැගින් | සිවම් ස්ටෝර්ස් |
| | (2) කේ. ඇස්. සිවසන්කරන් පිල්ලේ | ගොරක හොණ්ඩරය රු. 68 බැගින් | එම |
| | (3) ඇන්. ඇස්. ඇස්. ෂන්මුගසුන්දරම් ... | සියඹලා හොණ්ඩරය රු. 28 බැගින් | එම |
| | (4) වී. ටී. වී. දේවනායගම් ... | බොම්බයි ළූනු හොණ්ඩරය රු. 20·50 බැගින් | කේ. ඇස්. සිවසන්කරන් පිල්ලේ |
| | | අර්තාපල් රු. 19 ... | එම |
| | | මුංඇට රු. 34·50 බැගින් ... | එම |
| | | කෝපි රු. 162·90 බැගින් ... | එම |
| | | සුදුදුරු හොණ්ඩරය රු. 123 බැගින් | ඇන්. ඇස්. ඇස්. ෂන්මුග සුන්දරන් |
| | | කුරුඳු රු. 216 බැගින් | එම |
| | | මිරිස් රු. 81 බැගින් | වී. ටී. වී. දේවනායගම් පිල්ලේ සහ සමාගම |
| | | පරිප්පු රු. 42 බැගින් ... | එම |
| | | ගම්මිරිස් රු. 209 බැගින් ... | එම |
| ලෝටස් පාරේ පිහිටි ශීත කාමරයේ බිත්තර කැබීමට ප්‍රෙට්ස් පෙට්ටි 2,500ක් සැපයීම | (1) සීමාසහිත වෝකර් පුත්‍ර සමාගම ...<br>(2) කේ. ඇල්බට් පෙරේරා<br>(3) සී. එච්. සේනානායක<br>(4) පී. ජේ. ප්‍රනාන්දු<br>(5) ඩී. ඒ. ඇස්. දියස්<br>(6) ඩී. ඒ. ජේ. අප්පුහාමි<br>(7) ඇම්. ජේ. දියස්<br>(8) ගෘහකර්මාන්ත සහ ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂක<br>(9) ටී. ඩී. ඇම්. ඇෆ් ද සිල්වා<br>(10) වී. වී. තම්බිපිල්ලේ<br>(11) ඊ. ආර්. ප්‍රනාන්දු | ක්‍රෙට් පෙට්ටි 1ක් රු. 5·87 බැගින් | ටී. ඩී. ඇම්. ෆ්‍රැන්සිස් ද සිල්වා මයා. |
| 16.2.60 සිට 29.2.60 දක්වා කුළුබඩු සැපයීම | (1) සිවම් ස්ටෝර්ස් ... | ගම්මිරිස් හොණ්ඩරය රු. 195 බැගින් | සිවම් ස්ටෝර්ස් |
| | (2) ඇන්. ඇස්. ඇස්. ෂන්මුගසුන්දරම්<br>(3) වී. ටී. වී. දේවනායගම් පිල්ලේ ... | මිරිස් හොණ්ඩරය රු. 87·25 බැගින් | ඇන්. ඇස්. ඇස්. ෂන්මුග සුන්දරම් මයා |
| | (4) කේ. ඇස්. සිවසන්කරන් පිල්ලේ | කුරුඳු හොණ්ඩරය රු. 217 බැගින් | එම |
| | | කඩල පරිප්පු රු. 44·75 | එම |
| | | ගොරක රු. 86 බැගින් | වී. ටී. වී. දේවනායගම් සමාගම |

| ටෙන්ඩර් කැඳවීමේ කාරණය | ටෙන්ඩර්කරුවන්ගේ නම | විෂය පිළිගත් ගණන් | තෝරාගත් ටෙන්ඩරකරුගේ නම |
|---|---|---|---|
| බොරැල්ලේ තිබෙන මෙම දෙපාර්තමේන්තුව සතු බේකරියේ ජල නල ශුද්ධකිරීම සහ අළුත් වැඩියා කිරීම | (1) කේ. ඇම්. ප්‍රනාන්දු ...<br>(2) ඩී. සී. ඩී. පෙරේරා<br>(3) කේ. විල්මන්<br>(4) ඒ. දියස් අබේසිංහ<br>(5) සීමාසහිත සාමුවෙල් පුත්‍ර සමාගම<br>(6) සීමා සහිත "කලම්බු ගෑස් ඇන්ඩ් වෝටර් කොම්පැනිය"<br>(7) ඩබ්ලිව්. ඒ. පොඩිඅප්පුහාමි | ජලනල ශුද්ධකිරීමට සහ අළුත් වැඩියා කිරීමට රු. 680 | කේ. විල්මන් මහතා |
| 1.3.60 සිට 15.3.60 දක්වා කුළුබඩු සැපයීම | (1) ඇන්. ඇස්. ඇස්. ෂන්මුගසුන්දරම්<br>(2) සිවම් ස්ටෝර්ස් ...<br>(3) වී. ටී. වී. දේවනායගම් පිල්ලේ සමාගම | කඩල පරිප්පු හොණ්ඩරය රු. 45.85 බැගින්<br>කුරුඳු හොණ්ඩරය රු. 216·50 බැගින්<br>බොම්බයි ලූනු හොණ්ඩරය රු. 19 බැගින්<br>මිරිස් හොණ්ඩරය රු. 99 බැගින්<br>ගොරක හොණ්ඩරය රු. 86 බැගින් | ඇන්. ඇස්. ඇස්. ෂන්මුගසුන්දරම් මයා.<br>එම<br>වී. ටී. වී. දේවනායගම් පිල්ලේ සමාගම<br>එම<br>එම |
| 16.3.60 සිට 31.3.60 දක්වා කුළුබඩු සැපයීම | (1) වී. ටී. වී. දේවනායගම් පිල්ලේ සමාගම<br>(2) සේයදු ආදම් සහ සමාගම ...<br>(3) සිවම් ස්ටෝර්ස් ... | බොම්බයි ලූනු හොණ්ඩරය රු. 20- බැගින්<br>සුදු ළූනු රු. 85 ...<br>ගොරක හොණ්ඩරය රු. 85 බැගින්<br>සියඹලා හොණ්ඩරය රු. 35 බැගින්<br>කුරුඳු හොණ්ඩරය රු. 263 බැගින්<br>ගම්මිරිස් හොණ්ඩරය රු. 229 | වී. ටී. වී. දේවනායගම් පිල්ලේ සහ සමාගම<br>එම<br>එම<br>එම<br>සේයදු ආදම් සහ සමාගම<br>එම |
| අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට වේවැල් කූඩා සැපයීම | (1) කොම්පඤ්ඤවීථියේ වේවැල් සපයන සමාගම<br>(2) පී. විලියම් මයා.<br>(3) ඇස්. එච්. හේවාවිතරන මයා.<br>(4) වයි. ඇම්. සහිබු මයා.<br>(5) ඇම්. සලිම් මයා.<br>(6) ඩබ්ලිව්. ඩබ්ලිව්. රණසිංහ මයා.<br>(7) කොම්පඤ්ඤවීථියේ ජාතික කාර්මික ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ මයා.<br>(8) ඩී. සී. වලකුළුආරච්චි මයා. | ලොකු වේවැල් කූඩා 100 ... රු. 675 බැගින් සහ කූඩා වර්ගයෙන් 100 රු. 500 බැගින් ගෙනැවිත් බාරදීමට | ඇම්. සලිම් මයා, 57, කොට්ටරමුල්ල, ලුණුවිල |
| අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව සතු බේකරියට තේ පෙට්ටි සැපයීම | (1) එච්. සීමන් සිංඤෝ මයා. ...<br>(2) ජැෆ්පරී සහෝදරයෝ<br>(3) නීල් සහෝදර සමාගම<br>(4) එදිරිසිංහ සහෝදරයෝ<br>(5) ඒ. ඇෆ්. ජෝන් සමාගම<br>(6) ටී. බී. විමලවීර<br>(7) ඩබ්ලිව්. ගුණවර්ධන | ඇල්බිසියා ලී වලින් සැදූ තේ පෙට්ටි 1ක් රු. 4·95 බැගින් ගෙනැවිත් භාරදීමට | එච්. සීමන් සිංඤෝ මයා., 513, සිංහාරමුල්ල, කැළණිය |
| අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ ආයතනවලට 1960 මාර්තු තුල අළුත් බිත්තර සැපයීම | (1) සීමාසහිත සින්හැම් සහ පුත්‍ර සමාගම<br>(2) කොළඹ කේ. පී. ඊ.ඊ. සහ සමාගම<br>(3) සීමාසහිත ෂිපිං සප්ලයි සමාගම<br>(4) ඇස්. එච්. හැරන් මයා. ද. ඉන්දියාව | බිත්තර 1,000 රු. 190 බැගින් ගෙනැවිත් භාරදීමට | සීමාසහිත සින්හැම් සහ පුත්‍ර සමාගම, තැ. පෙ. 402, කොළඹ |
| 1960 අප්‍රියෙල් මස තුල අළුත් බිත්තර සැපයීම | (1) ඇස්. එච්. හැරන් මයා. ද. ඉන්දියාව<br>(2) කොළඹ කේ. පී. ඊ. ඊ. සහ සමාගම | බිත්තර 1,000 රු. 190 බැගින්, ගෙනැවිත් භාරදීමට | කේ. පී. ඊ. සහ සමාගම, 242, බංගසාල වීථිය, කොළඹ 1 |

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව
62, වැතම් වීථිය,
කොළඹ 1,
දිනය : 30.4.60.

ඇල්. බී. රාජකරුණා,
අලෙවිකිරීමේ කොමසාරිස් තුමා වෙනුවට.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

"ෆයිබර් ග්ලාස් ඩිංජිස්" අටක් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

### ටෙන්ඩර් ප්‍රතිඵල

**ටෙන්ඩර් අයදුම්කරුවෝ :**

(1) කොළඹ, සීමාසහිත වෝකර් පුත්‍රයෝ සහ සමාගම.

(2) ඕස්ට්‍රේලියාවේ, සිඩ්නි හි ලෙස්ලි ස්කොට්.

ප්‍රතිඵලය.—වටිනාකම ඉන්ෂුවරන්ස් සහ නැව් ගාස්තු සමග මුළු මුදල වන ඕස්ට්‍රේලියානු පවුම් 1,591, සිලිං 12, පැන්ස 0 ට "ෆයිබර් ග්ලාස් ඩිංජිස්" අටක් සැපයීම සඳහා සීමාසහිත වෝකර් පුත්‍ර සහ සමාගම විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් අයදුම් පත පිළිගැණිනි.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1960 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදීය.

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1960 මාර්තු මස ටෙන්ඩර් පිළිබඳ ඇතිකර ගත් තීරණ

| සේවය | ටෙන්ඩර්කරුවෝ | සාර්ථකවූ ටෙන්ඩර් කරුවන් හා පිළිගත් ගාස්තු |
|---|---|---|
| ප්‍රිෆැබ්‍රිකේටඩ් තහඩු ගසා සෑදූ තාවකාලික ගොඩනැගිලි සැපයීම | 1. කන්ටිනැන්ටල් ඉංජිනියරින් සමාගම, ජොහැන්නස්බර්ග් | ... සීමා සහිත ඩෙක්සියන් සහ සමාගම |
| | 2. සෝසටික් ඇෆ්‍රිකනික් ඩි මැටීරියන්—කොන්ස්ට්‍රක්ෂන්—බ්‍රසල්ස් 4 | |
| | 3. එෆ්. ෆිලෝඩ්—ඇෆ්. ඇස්. ඒ | ... ප. 41,372, සී. 19, පැ. 2 |
| | 4. සැක්බ්‍රි ඉංජිනියරින් කෝපරේෂන්, කල්කටා—35 | |
| | 5. බට්ලර් ඉන්ටර්නැෂනල් කොම්පැණි යු. ඇස්. | |
| | 6. ලෙස්ලි ස්කොට්—සිඩ්නි | |
| | 7. ඩෙක්සියන් සහ සමාගම—ලන්ඩන් | |
| | 8. සිල් ෆ්‍රැන්සිස් ඩි එන්ටර්ප්‍රයිස්සස්—පැරිස් | |
| | 9. ඇකොමල්—බෙල්ජියම | |
| | 10. ෆ්‍රෙඩ්ක් බ්‍රබ් සහ සමාගම—ලන්ඩන් | |
| | 11. රොයි ට්‍රෙඩින් කොම්පැණි—සැන්ප්‍රැන්සිස්කෝ | |
| | 12. කේ. ඩී. ඒ. ඩි. සිල්වා—කොළඹ | |
| | 13. චූ කෙට්සු කෝකි සහ සමාගම—ජපානය | |
| | 14. සීමා සහිත වෝල්කර් ග්‍රීග්—කොළඹ | |
| | 15. කලම්බු කොමාර්ෂල් කොම්පැනි—කොළඹ | |
| | 16. සීමා සහිත මැක්වුඩ්ස්—කොළඹ | |
| | 17. සීමා සහිත බ්‍රවුන් සහ සමාගම—කොළඹ | |
| | 18. සීමා සහිත හේමන් කන්ස්ට්‍රක්ෂන්—ලන්ඩන් | |
| | 19. විලියම් බෙන් සහ සමාගම— | |
| | 20. විකර්ස් ආමර්ස්ටෝන්ස් (එයර් ක්‍රාෆ්ට්)—ලන්ඩන් | |
| | 21. සීමා සහිත එන්ගලෝ ඒසියන්—කොළඹ | |
| | 22. සීමා සහිත ඕස්ට්‍රේලියන් මෙඩිකල් ඇක්ස්පෝර්ට් කොම්පැණි—මැල්බෝන් | |
| | 23. සීමා සහිත ඔසකා කෝසායි කොම්පැණි—ඔසාකා | |
| | 24. සීමා සහිත ඇස්. ඒ. ආර්. ඇල්. ආයුබ්ෆ්‍රියර්ස්—පැරිස් | |
| | 25. ඩරීසල් අයිඩොකෝ කොම්පැණි—ඕහියෝ | |

ඇස්. නමසිවායම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.